ආයතනයේ නම : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 95

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 95

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution : Ministry of Finance, Planning and Economic Development

Parliamentary Series : 95

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම : මුදල්, ක්‍රමසම්පාදන
සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 95

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 95

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

<u>පටුන</u>

අනු අංකය	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු	පිටු අංකය
1.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	1 - 15
2.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	16-25
3.	ශ්‍රී ලංකා රේගුව	26
4.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	27

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 95

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

2023 මාර්තු 23

	සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු	- ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන්දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් - කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග
04	<u>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)</u> දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) සිදු කළ යුතු තාක්ෂණික වෙනස්කමක් සිදු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති නමුත්, එය නිවැරදි නොවීම හේතුවෙන් මෙම ආයතන දෙකෙහි පද්ධතීන් ඒකාබද්ධ කිරීමට නොහැකි තත්වයක් උද්ගතව ඇති බව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය සමඟ අනෙකුත් ආයතනවල දත්ත පද්ධතීන් සම්බන්ධවීමේදී එලෙස සම්බන්ධ කිරීමට අදාළ අන්‍යය ඩිජිටල් හඳුනාගැනීමේ අංකයක් (Unique Digital Identification Number) නොමැති වීම දත්ත පද්ධතීන් ඒකාබද්ධ කිරීමේ මූලිකම ගැටළුව වී ඇති බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.	අදාල තාක්ෂණික ගැටළුව නිරාකරණය කර ඇත. ඒ අනුව, සමාගම් ලියාපදිංචි කිරීමේදී ලිපිනය ඇතුළත් කිරීමේ බාධාවන් ඉවත් කර ඇත.

05	**<u>2023.01.24</u>** <u>දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ **RAMIS** හි ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u> එම පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්තුව භාර ගෙන ඒ සඳහා දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගතව ඇති සිංගප්පූරු සමාගම විසින් 2024 වර්ෂයේදී RAMIS පද්ධතියේ වැඩි දියුණු කිරීම් සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කර ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. තවද, මෙම RAMIS පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත සම්බන්ධ ගැටළු මතු විය හැකි බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.	RAMIS 2.0 ට අදාළ ගිවිසුම අනුව වැඩිදියුණු කිරීම් අවසන් කර පද්ධතිය ස්ථාපනය කර ඇත. තවද තක්සේරු වර්ෂ 2019/2020 සිට 2022/2023 දක්වා බදු ප්‍රතිපත්ති වෙනස්වීම් අනුව පද්ධතියේ ඒ ඒ තක්සේරු වර්ෂ වලට අදාල වැඩි දියුණු කිරීම් සිදු කරමින් පවතී. එම වැඩි දියුණු කිරීම් 2024 වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කෙරේ.

	සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු	- ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන්දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් - කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ / නියෝග
01	<u>මුළු හිඟ බදු, දඩ හා පොළී ආදායම</u> මුළු හිඟ බදු, දඩ හා පොළී ආදායම තුළ RAMIS හා Legacy පරිගණක පද්ධතීන් තුළ 2022.12.31 දිනට අයකළ හැකි ආදායම රු. 163,425,093,401/- ක් බවත්, එම මුළු එකතුවෙන් රු. 109,368,553,575/- ක් RAMIS පද්ධතියට අයත් බවත්, රු. 54,056,539,826/- ක් Legacy පද්ධතියට අයත් බවත් අනාවරණය විය.	2022.12.31 දිනට අය කළ හැකි ආදායම රු.163,425,093,401/- ක් වන අතර, ඉන් රු. 109,368,553,575/- ක් RAMIS පද්ධතියට හා රු. 54,056,539,826/- ක් Legacy පද්ධතියට අයත් වන අතර, දක්වා ඇති නිරීක්ෂණය නිවැරදි වේ.
	<u>නිර්දේශ/නියෝග</u> එම අය කළ හැකි මුළු ආදායම වූ රු. 163,425,093,401/- ක් අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් ඇතුළත් වාර්තාවක් (Individual Breakup) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.)/ ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත නියෝග කළේය.	ඊට අමතරව 2023 වර්ෂය තුළ හිඟ බදු රැස් කිරීම පහත පරිදි වේ.
		2023 වර්ෂය තුළදී මුදලින් රැස් කළ හිඟ බදු ප්‍රමාණය - රු. 68,346,293,941.36
	ඉහත හිඟ බදු, දඩ හා පොළී රු. 904,342,180,778/- තුළ, (i) අය කළ හැකි හිඟ බදු , දඩ හා පොළී ප්‍රමාණය, එලෙස අය කළ හැකි ආදායම කොටස් වශයෙන් හෝ අය කර ගන්නා ආකාරය පිළබඳ දින වකවානු සහිතව සහ,	2023 වර්ෂය තුළදී ගැලපීම් මඟින් නිරවුල් කළ හිඟ බදු ප්‍රමාණය - <u>රු.95,154,245,286.66</u>
	(ii) අය කළ නොහැකි හිඟ බදු ,	2023 වර්ෂය තුළදී අඩු කරන ලද මුළු හිඟ බදු ප්‍රමාණය - <u>රු.163,500,539,228.02</u>

	දඩ හා පොළී ප්‍රමාණය හා එලෙස අය කළ නොහැකි වීමට හේතූන් කපා හරිනු ලබන හිඟ බදු, දඩ හා පොළී ඇත්නම් ඒ කවරේද යන්නත් ඒවා කපා හැරීමට හේතූන් කවරේද යන්නත් පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක්, 2023 ජූනි මස 15 දිනට ප්‍රථම කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කළේය. දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ **2023.06.15** දිනැති අංක **FPFS/comm/2023/25** දරන ලිපිය මගින් උක්ත වාර්තාව ඉදිරිපත් කර ඇත.	

02	**Legacy** පද්ධතියට අයත් මුළු නිහ බදු, දඩ හා පොළී ආදායම අයකර ගැනීම සම්බන්ධයෙන් අධිකරණ කටයුත්තකට යොමුව තිබේද යන්න හා එම නිහ බදුවලට අදාළ බදු අභියාචනාවල අභියාචන කාල සීමාව බදු ගෙවන්නා විසින් බදු අභියාචන ක්‍රියාවලියට යොමු වුවහොත් එම බදු අයකිරීම් තාවකාලිකව අත්හිටවනු ලබන බවද රජයේ මැදිහත්වීම මත හෝ බදු සම්බන්ධ නඩු කටයුතු සඳහා වෙනමම අධිකරණයක් (Dedicated Court) පැවතීමේ අවශ්‍යතාවය ද ග.නි. කාරක සභාව හමුවේ පෙන්වා දුන්නේය.	යම් නිහ බද්දක් අය කර ගැනීම සඳහා අධිකරණයේ නඩු පැවරූ විට දෙපාර්තමේන්තුව විසින් අය කටයුතු අත්හිටුවනු ලබයි. එම නිහ බද්ද අය කර ගැනීමට හැකි වනුයේ නඩු කටයුතු අවසන් වීමෙන් පසුවය. මේ සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බැවින්, එලෙස ගතවන කාලය අඩු කර ගැනීම පිණිස බදු කටයුතු සඳහා වෙන් වූ අධිකරණයක් පිහිටු වීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා මුදල් අමාත්‍යාංශයෙන්ද, ජාතික ආර්ථික සවිබල ගැන්වීම හා හෞතික සැලසුම් සඳහා වූ ආංශික කාරක සභාවෙන්ද ඉල්ලා ඇත.
03.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් **81** දෙනෙකුට **RAMIS** පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැටුප් ගෙවීම	

	RAMIS පද්ධතිය සංවර්ධනයෙන් පසු අදාළ සංවර්ධනකරු විසින් පද්ධතිය පරීක්ෂා (To test) කිරීමට කාලයක් ලබා දෙන බවත්, ඒ සෑම පරීක්ෂාවකටම අදාළ Test Scenario ලිවිය යුතු බවත්, පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළව හඳුනාගත් අඩුපාඩු නිවැරදි ක්‍රියාකාරීත්වයට පත් කිරීම තෙක් පරීක්ෂා කිරීමේ ක්‍රියාදාමය සිදුවන හෙයින් එම පරීක්ෂා කිරීමේ කටයුතු වල නියුතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේම සාමාන්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට එම කාර්යය උදෙසා අමතර ගෙවීමක් සිදු කරන බවද ග.නි. ප්‍රකාශ කළේය. තවද, දත්ත උපුටා ගැනීම (Data Extract) කළ පසු ඒ සම්බන්ධ කටයුතු කිරීම සඳහා දත්ත විද්‍යාව (Data Science) සම්බන්ධ දැනුමැති නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ නොමැති බවද ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	RAMIS පද්ධතිය සංවර්ධනයෙන් පසු පරිශීලක පිළිගැනීමේ පරීක්ෂා සිදුකිරීම සඳහා (UAT) තෝරා ගන්නා ලද දේශීය ආදායම් සේවයේ නිළධාරීන් අමතර ගෙවීමක් මත RAMIS ව්‍යාපෘතියේ සේවයට යොදා ගනු ලැබූ අතර, මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත 2024 වර්ෂය සඳහා එම නිළධාරීන් සංඛ්‍යාව 60 ක් දක්වා අඩු කර ඇත.
04.	**<u>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සිටින බදු තක්සේරුකරුවන් (Tax Assessors) ප්‍රමාණය සහ බදු අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු ලිපිගොනු (Tax Files) ප්‍රමාණය</u>** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු තක්සේරුකරුවන් (Tax Assessors) කොපමණ සිටීද යන්න පිළිබඳ කාරක සභාව විමසූ අතර, එම කාර්යය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් හා ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරුන් හයසියයකට ආසන්න ප්‍රමාණයක් සේවයේ නියුක්ත බව ග.නි. ප්‍රකාශ කළේය. බදු අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු ලිපිගොනු (Tax Files) කොපමණ පවතීද යන්න පිළිබඳ කාරක සභාව විමසූ අතර, එවැනි තනි පුද්ගල	**ඇමුණුම - 01 (මේ සමඟ යාකර ඇත)**

	ලිපිගොනු ලක්ෂ 03 කට ආසන්න සංඛ්‍යාවක් ඇති බවද ග.නි. ප්‍රකාශ කළේය.	
05.	**<u>RAMIS පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ නිලධාරීන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු නොවීම</u>** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නඩත්තු කළ හැකි මොඩියුල කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරීන් (ICT Officer) 39ක සේවක සංඛ්‍යාවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බවත් ග.නි. ප්‍රකාශ කළේය. තොරතුරු තාක්ෂණ සේවා වලට රාජ්‍ය සේවයේ පවතින වැටුප් ව්‍යුහය ප්‍රමාණවත් නොවන බැවින්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල තොරතුරු තාක්ෂණ සේවා සැපයීමට සම්පූර්ණ සුදුසුකම් සහිත නිලධාරීන් අමාත්‍යාංශය යටතේ බඳවා ගෙන අදාළ ආයතනවල සේවා සැපයීමේ කටයුතු කරගෙන යාමට ඉදිරියේදී අපේක්ෂා කරන බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය ක්‍රියාත්මක කරනු ලබන දත්ත මධ්‍යස්ථානයේ (Data Center) තොරතුරු තාක්ෂණ නිලධාරී (ICT Officer) ලෙස පුහුණු වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඒ වන විට සේවයේ නියුක්තව සිටි තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරියා (ICT Assistant), මේ වන විට තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරට උසස්වීම් ලබා ඇති හෙයින් එම නිලධාරියා	RAMIS පද්ධතියේ Call Center, RAMIS Helpdesk සහ IRD Web පිටුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලබන අතර, පද්ධතියේ නඩත්තුව දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාලව සැලැස්ම (Takeover Plan) සකස්කර අවසන් කර ඇත. එම සැලැස්ම මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නියමිත වේ.

	ඉදිරියේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු (Transfer) වීම මඟින් දත්ත මධ්‍යස්ථානයේ සේවාවන්ට ගැටළුකාරී තත්වයක් ඇති විය හැකි බව කාරක සභාවේ අවධානයට ලක් විය. **<u>නිර්දේශ/ නියෝග</u>** ඒ අනුව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ උපදෙස් පරිදි, එම තොරතුරු තාක්ෂණ නිලධාරියා තවදුරටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේම සේවයේ තබා ගැනීම සඳහා, එම ස්ථාන මාරු කිරීම අත්හිටුවීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කරමින් ලිපියක් ඉදිරිපත් කරන ලෙසට මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව උපදෙස් දුන්නේය.	
06.	**<u>RAMIS පද්ධතිය තව දුරටත් සංවර්ධන කිරීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා RAMIS පද්ධතියේ සංවර්ධනකරු (Developer)අතර ඇති කරගත් නඩත්තු කිරීමේ ගිවිසුම (Maintenance Agreement) 2024 ජනවාරි 01 දින වන විට අවසන් වීම</u>** **<u>නිර්දේශ / නියෝග</u>** RAMIS පද්ධතියට අදාළ නඩත්තු කිරීමේ ගිවිසුම (Maintenance Agreement) 2024 ජනවාරි 01 දින වන විට අවසන් වීමෙන් පසුව පද්ධතියේ හිමිකම මුළුමනින්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හිමි වන දින වකවානුව, එලෙස හිමිකාරිත්වය ලබා ගත් පසු RAMIS පද්ධතියෙහි පූර්ණ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කාල වකවානු සහිත වැඩපිළිවෙල සහ පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ පසු එහි ක්‍රියාකාරිත්වයන්ට අදාළව වගකීම් භාර දෙනු ලබන නිලධාරීන් පිළිබඳ	RAMIS පද්ධතිය නඩත්තු කිරීම සඳහා වර්තමාන නඩත්තුකරු වෙත ඉදිරි වසර 03 සඳහා (2024 පෙබරවාරි සිට 2027 ජනවාරි දක්වා) පැවරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එම කාලය සඳහා නව ගිවිසුමකට එළඹ ඇත.

	තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් 2023 ජූනි මස 15 දිනට ප්‍රථම කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කළේය. දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ 2023.06.15 දිනැති අංක FPFS/comm/2023/25 දරන ලිපිය මගින් උක්ත වාර්තාව ඉදිරිපත් කර ඇත. 2017 වර්ෂයේ නව දේශීය ආදායම් පනත හඳුන්වා දීමත් සමඟ පැවති RAMIS 1.0 පද්ධතියට අලුතින් හඳුන්වා දුන් බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත RAMIS 2.0 නව පද්ධතියක් (version) හඳුන්වා දීමට සිදුවූ බවත්, ඉදිරියේදී නව බදු ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ලැබුවහොත් RAMIS 2.0 පද්ධතිය තුළද එය ක්‍රියාත්මක කළ නොහැකි වීමේ ගැටළුකාරී තත්වයක් පවතින බවද මෙහිදී අනාවරණය විය. <u>නිර්දේශ / නියෝග</u> RAMIS 2.0 පද්ධතියේ මොඩියුල 19න් 13ක් මේ වන විට ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය කළ කාරක සභාව, එම මොඩියුල 13 වෙන් වෙන් වශයෙන් සම්පූර්ණයෙන් ක්‍රියාකාරී තත්වයට පත් කළ හැකි කාල වකවානුව සම්බන්ධ විස්තර ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කළේය. <u>පිළිතුරු</u> • RAMIS 2.0 පද්ධතියේ කිසිදු මොඩියුලයක් අක්‍රිය තත්වයේ නොමැති බවත්, සියලු මොඩියුල සංවර්ධය කරමින් හා පරිශීලක පරීක්ෂණයන් සිදු කරමින් පවතින බවත් දන්වා ඇත. RAMIS පද්ධතියේ ක්‍රියාකාරීත්වයට අදාළ නෙවන	

	පාර්ශ්වීය තත්ත්ව සහතිකය (Third Party Quality Assurance) මොරටුව විශ්වවිද්‍යාලය මගින් සපයන බව හා RAMIS 2.0 පද්ධතිය තුළ යම් වෙනස් කිරීම් සඳහා වූ ඉල්ලීම් (Change Request) සිදු කිරීමේදී අදාළ තත්ත්ව සහතිකය ලබාදීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමඟ ඇති කර ගත් සමස්ත කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 58කට ආසන්න බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.	RAMIS 2.0 ට අදාල සියළුම මොඩියුල සංවර්ධනය කර ස්ථාපිත කර ඇත. තක්සේරු වර්ෂ 2019/2020 සිට 2022/2023 දක්වා බදු ප්‍රතිපත්ති වෙනස්වීම් අනුව පද්ධතියේ ඒ ඒ තක්සේරු වර්ෂ වලට අදාල වැඩි දියුණු කිරීම් සිදු කරමින් පවතී. එම වැඩි දියුණු කිරීම් 2024 වර්ෂය තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. RAMIS 2.0 අදාලව තෙවන පාර්ශ්වීය තත්ව සහතිකය සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ ඇතිකරගත් ගිවිසුම මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉදිරි වසර තුන සඳහා අදාල නව නඩත්තු ගිවිසුමට අදාල තෙවන පාර්ශ්වීය තත්ව සහතිකය ලබා ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ නව ගිවිසුමකට එළඹීමට අපේක්ෂා කෙරේ.
07.	<u>චෙක්පත් හරහා බදු ගෙවීමේදී චෙක්පත් අගරු වීම හේතුවෙන් බදු ගෙවීම සඳහා විකල්ප ක්‍රම ලෙස බැංකු අණකර</u>	2022 ජුනි මස 30 වන දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අය විය යුතු අගරු චෙක්පත් හි වටිනාකම රු. බිලියන 2.4 ක්

	<u>භාවිතයට යොමු වන ලෙස පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී නියෝග කළ නමුත් එය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව සහ, 2022 ජූනි මස 30 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු අගරු චෙක්පත්හී වටිනාකම රු. බිලියන 2.4ක් පැවතීම</u> රටේ සාමාන්‍ය නීතිය අනුව අගරු චෙක්පත් ඉදිරිපත් කරන පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගතහැකි වුවද, දේශීය ආදායම් පනත අනුව අගරු චෙක්පත් ඉදිරිපත් කරන බදුකරුට එරෙහිව නීතිමය කටයුතු කළ නොහැකි වීමට හේතුව කුමක්ද යන්න පිළිබඳව කාරක සභාව විමසා සිටියේය. බදු ගෙවන්නා විසින් ගෙවිය යුතු බදු මුදල්, චෙක්පත් මාර්ගයෙන් මහජන බැංකුව හෝ ලංකා බැංකුව හරහා ගෙවන බවත්, වැඩිපුර බදු මුදල් ගෙවීම් සිදු වන්නේ ලංකා බැංකුව හරහා බවත් කාරක සභාවේදී අනාවරණය විය. මහජන බැංකුව විසින් එලෙස ලැබෙන චෙක්පත් නිෂ්කාෂණය වූ පසු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කරන බව හා ලංකා බැංකුව විසින් චෙක්පත නිශ්කාෂණය වීමට පෙර එම මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කරන බවත්, කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර වූ බව පෙන්වුවද නිශ්කාෂණයේ දී චෙක්පත අගරු චෙක්පතක් බවට පත්වුවහොත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමෙන් එම චෙක්පත් වටිනාකම ඉවත් වන බවද කාරක සභාව හමුවේ අනාවරණය විය. <u>නිර්දේශ / නියෝග</u> මෙම ගැටළුව විසඳීම සඳහා ලංකා	වුවද 2024.06.30 දිනට වාර්තාව පරිදි නිරවුල් කිරීමට ඇති අගරු චෙක්පත්වල වටිනාකම රු. බිලියන 1.4 ක් දක්වා අඩු වී ඇත. අගරු වූ චෙක්පත් ඉදිරිපත් කරන පුද්ගලයන්ගෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව චෙක්පතෙහි වටිනාකමින් 10% ක දඩ මුදලක් ද සමඟ චෙක්පතේ වටිනාකම අයකිරීම සිදු කරනු ලබයි. එසේම චෙක්පත් මඟින් ගෙවා ඇත්තේ බදු ගෙවන්නන් විසින් ගෙවිය යුතු බදු මුදලකි. එබැවින්, චෙක්පත් අගරු වූ විට බදු ගෙවන්නා වෙනුවෙන් හිඟ බද්දක් උද්ගත වීම සිදු වේ. එම හිඟ බදු සම්බන්ධයෙන් හිඟ බදු අයකිරීම සඳහාම පිහිටුවා ඇති විශේෂ අංශ මඟින් සහ සියලුම ප්‍රාදේශීය කාර්යාල මඟින් අය ක්‍රියාමාර්ග ගනු ලැබේ. එහිදී අවශ්‍ය වන විට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමද සිදු කරනු ලබයි. එසේ හිඟ බදු අයකිරීමට කටයුතු කිරීම මඟින් අගරු චෙක්පත් අයකිරීමේ කටයුතු යථාවත් වීම සිදුවේ. 2023 අගෝස්තු මස සිට මහජන බැංකුව මෙන්ම ලංකා බැංකුව විසින් ද ලැබෙන චෙක්පත් නිශ්කාශනය වූ පසු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කිරීම සිදු කරනු ලබයි. එසේම 2024.04.04 දින නිකුත් කර ඇති අංක 2378/33 දරණ ගැසට් නිවේදනය පරිදි 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතින් පාලනය වන බදු ගෙවීම්, මුදල් තැන්පත්, බැංකු අණකර හෝ OTTP භාවිත කිරීම යන ක්‍රම මඟින් පමණක් සිදු කළ යුතු බැවින් චෙක්පත් අගරු වීම යම්තාක් දුරට පාලනය වීමක් සිදු වී ඇත.

	බැංකුව, මහජන බැංකුව හා ලංකා ක්ලියර් පුද්ගලික සමාගම සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගන්නා ලෙස කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි.ට නියෝග කළේය.	
08.	<u>කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යන්නන් විසින් වාර්ෂිකව රුපියල් මිලියන 200ක බද්දක් ගෙවිය යුතු බවත්, නියමිත දිනට පසුව ගෙවන වාර්ෂික බද්දට දඩ මුදලක් අයවිය යුතු වීම</u> ශ්‍රී ලංකාව තුළ කැසිනෝ ව්‍යාපාරයේ නියතු ආයතන 4ක් ඇති බවත් හා ඒ අතරින් කැසිනෝ ව්‍යාපාර 2කින් හිඟ බදු මුදල පමණක් අයකර ඇතත්, ඊට අදාළ දඩ පොළී අයකිරීමට කටයුතු කර නොමැති බවත්, තවත් ව්‍යාපාර දෙකක් වෙතින් අය විය යුතු හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබීම. <u>නිර්දේශ / නියෝග</u> (i) හිඟ බදු මුදල පමණක් අයකර ගෙන ඇති කැසිනෝ ව්‍යාපාර දෙකෙහි ඊට අදාළ දඩ පොළී අය කිරීමට කටයුතු කර තිබේද යන්න සහ වාර්ෂික බදු මුදල් නොගෙවූ කැසිනෝ ව්‍යාපාර දෙක සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය පියවර පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස	මෙහි සඳහන් කැසිනෝ ව්‍යාපාර දෙක එකම පරිශ්‍රයේ ලිපිනයන් දෙකක් යටතේ පවත්වාගෙන යනු ලබයි. I. කොරෝනා වසංගත කාලය තුළදී එක් ව්‍යාපාරයක් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා නොහැකි නිසා වසා ඇති බව පවසමින් වාර්ෂික බදු මුදල් ගෙවීම පැහැර හැර ඇත. ඒ අනුව 2020/2021 හා 2021/2022 තක්සේරු වර්ෂයන්ට අදාලව වර්ෂයකට ගෙවිය යුතු රු. මිලියන 200 බැගින් වූ වාර්ෂික බදු මුදලින් රු. මිලියන 150 බැගින් නොගෙවීම හේතුවෙන් රු. මිලියන 300 ක වාර්ෂික බදු මුදලක් ගෙවීම පැහැර හැර ඇත.

	කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කළේය. දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ **2023.06.15** දිනැති අංක **FPFS/comm/2023/25** දරන ලිපිය මගින් උක්ත වාර්තාව ඉදිරිපත් කර ඇත.	II. නිකුත් කරන ලද හිඟ බදු නිවේදනයට බදු ගෙවන්නා විසින් කරුණු ඉදිරිපත් කරමින් විරෝධතා ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කැඳවා මුදල් අමාත්‍යාංශයේදී 2023.08.03 දින පැවති සාකච්ඡාව අනුව 2023.08.14 දින බදු ගෙවන්නාගේ ඉල්ලීම සහ එහි නීතිමය තත්වය පිළිබඳව නීතිපති වරයාගේ අදහස් විමසන ලදී. III. එම කැසිනෝ ව්‍යාපාරය විසින් ව්‍යාපාරය පවත්වාගෙන යාම මත අදාල වාර්ෂික හිඟ බද්ද ගෙවිය යුතු බවට දන්වමින් නීතිපතිවරයාගේ මතය 2024.06.05 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇත. දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව බදු ගෙවන්නා වෙත දැනුම් දුන් අතර නැවතත් එම ව්‍යාපාරය විසින් දෙපාර්තමේන්තුව වෙත විරෝධතා ඉදිරිපත්කරන ලදී. නමුත් එම විරෝධතාවය නොසලකා අයකර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර, අදාල කැසිනෝ ආයතනය වෙතින් හිඟ බදු අය කර ගැනීමේ ක්‍රියා මාර්ගයක් ලෙසින් 2024.11.04 දින වන විට බැංකු තහනම් කිරීමේ නියෝග නිකුත් කර ඇත.
	(ii) බදු පරිපාලනය සම්බන්ධයෙන් පවතින ගැටළු හඳුනාගනිමින් ඒවාට විසඳුම් සොයා බැලීම සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර අවම වශයෙන් මාසයකට දෙවරක්වත් රැස්වී අදාළ සාකච්ඡා පවත්නමින් ආයතන දෙක අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත	

	නියෝග කළේය. මෙම රැස්වීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තවත් මාසයකට පසුව නැවත කාරක සභාව හමුවට කැඳවන බව ගරු සභාපතිවරයා දැනුම් දුන්නේය.	

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 95 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ්. සේපාලිකා චන්දසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් වින්තම්පලම් ඒ්. ගාඩිනර් මාවත
කොළඹ-02.

ಅನುಬಂಧ-01

Cadre of the Department as at 30.09.2024

Post	Service & Grade	Approved Cadre	Number in Post	Vacancies
Snr. Deputy Commissioner	SLIRD - I	1107	280	250
Deputy Commissioner	SLIRD - II		372	
Assistant Commissioner	SLIRD - III		205	
Total		1107	857	250

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 95

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය
09	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණය හරහා රජයේ ආදායම වර්ධනය කර ගැනීමට අදාල සැලසුම්	• සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය සඳහා අංශයක් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇත. එම අංශය විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු ආදායම වර්ධනය කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු ඇතුළත් කර සුරාබදු ආදායම ආරක්ෂා කර ගැනීමට ඇති බාධක හඳුනා ගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකසා ඇත. ඒ අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු ආදායම ආරක්ෂා කිරීමට ඇති අවධානම ශූන්‍ය කිරීම සඳහා හඳුනාගත් කරුණු සම්බන්ධයෙන් අදාල දත්ත රැස්කර විශ්ලේෂණය කිරීම මේ වන විට සිදු කරමින් පවතී. අවදානම් කළමනාකරණය අංශයට පත්කර ඇති නිලධාරී ලැයිස්තුව මේ සමග අමුණා ඇත. (ඇමුණුම 01) • ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සියලුම සුරාබදු පරිපාලන කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා දිගු කාලීන ක්‍රියා මාර්ගයක් ලෙස හඳුනාගත් යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ස්ථාපිත කිරීම පිණිස විසඳුම් සපයන්නෙකු (Solution Provider) තෝරා ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමට අවශ්‍ය ලංසු ලේඛන සැකසීම වෙනුවෙන් ප්‍රසම්පාදක උපදේශකයෙකු ජාතික තරඟකාරී ලංසු ක්‍රමයෙන් දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් අතර, ඔහුගේ සේවාව 2024.08.08 වන දින සිට දෙපාර්තමේන්තුව ලබා ගනී. එම ලංසු ලේඛන සැකසීමේදී මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ලේඛනය සැකසීම ප්‍රධාන අංගයක් වන අතර, දැනටමත් දෙපාර්තමේන්තුව විසින් විෂය කරුණු පිළිබඳ විශේෂඥ දැනුම හා අත් දැකීම් සහිත නිලධාරීන්ගේද සහාය ඇතිව එහි දෙවන කෙටුම්පත සකස් කර ඇති අතර එහි තව දුරටත් සංශෝධනය සිදු කිරීම පිණිස සාකච්ඡා 2024.08.16 වන දින සිට 2024. 09. 12 දක්වා සිදු කරන ලදි. එම සාකච්ඡා වට වලදී හඳුනා

		ගත් නව කරුණු ද ඇතුළත් කරමින් මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ලේඛනයේ තුන්වන කෙටුම්පත මේ වන විට සකසමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා විසඳුම් සපයන්නෙකු 2025 පෙබරවාරි මස වන විට තෝරා ගැනීමට දෙපාර්තමේන්තුව දැනට සැලසුම් කරමින් පවතී. • රජයේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ක්‍රියා මාර්ග ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මේ 2024 වර්ෂයේ දෙවන කාර්තුව දක්වා ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ලද ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය ඇතුළත් වාර්තාව ඇමුණුම අංක 02 ලෙස ඉදිරිපත් කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 95 සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

සුරාබදු කොමිසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

යූ.එල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

ආදායම් වර්ධනය සඳහා වන යෝජනාවලිය - ක්‍රියාකාරී සැලැස්ම 2024
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ඇමුණුම 01

අංකය	යෝජනාව	අරමුණ	ආදායම් වර්ධනය සඳහා වන යෝජනා	අදාල කාර්යයන්	ප්‍රගතිය
01	කෙටිකාලීන	2023 වර්ෂයට සාපේක්ෂව නිෂ්පාදනය 5%කින් වැඩි කර ගැනීම මගින් රුපියල් බිලියන 210 ක ආදායමක් උපයා ගැනීම	මත්පැන් නිෂ්පාදනාගාර අදාල නිෂ්පාදන ඉලක්කයන් වෙත ළඟා කරවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.	1.1.නිෂ්පාදන ඉලක්ක ලබාදීම	2024 වර්ෂය සඳහා නිෂ්පාදනාගාර ඉලක්කයන් 2024.01.17 දින නිෂ්පාදනාගාර නිලධාරීන්ට, සහකාර සුරාබදු කොමසාරිස් වරුන්ට, සුරාබදු අධිකාරිවරුන්ට හා බලපත්‍රධාරීන්ට ලබාදී ඇත.
				1.2.නිෂ්පාදනාගාර සමඟ මාසිකව නිෂ්පාදන ඉලක්ක වෙත ලඟාවීම පිළිබඳව සමාලෝචනය හා අදාළ උපදෙස් ලබා දීම.	නිෂ්පාදනාගාර ආදායම් හා නිෂ්පාදන ඉලක්ක ලබාදීමේදී මෙන්ම අවශ්‍ය අවස්ථාවන්හිදී නම් කරණ ලද බලපත්‍රධාරීන් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා අවශ්‍ය උපදෙස් ලබාදීම මෙන්ම ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගති සමාලෝචනයද සිදුකොට ඇත.
				1.3.නිෂ්පාදනාගාර බලපත්‍රධාරීන් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා පසු විපරම් කිරීම හා දැනුවත් කිරීම	2024.01.16 හා 2024.02.02 යන දිනයන් හි නිෂ්පාදනාගාර ප්‍රගති සමාලෝචනය, 2024.01.17, 2024.02.19, 2024.04.26 හා 2024.05.13 යන දිනයන් හි ස.සු.කොං සහ සු.අධිකාරි, සු.ස්ථානාධිපති ප්‍රගති සමාලෝචනය, 2024.01.31 බෝතල් රා නිෂ්පාදකයින් සඳහා රැස්වීම, 2024.03.07 එතනෝල් මිල අඩු කිරීම සම්බන්ධ රැස්වීම සහ 2024.03.19 මත්පැන් බලපත්‍රධාරීන්ගේ සංගමය සමඟ ආදායම් ඉලක්ක හා ඔවුන්ගේ ගැටළු සම්බන්ධව සාකච්ඡා කිරීමේ රැස්වීම මගින් ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කර ඇති අතර 2024.03.19 දිනැති සු.කොං.ජ.ගේ නිෂ්පාදනාගාර ප්‍රගති සමාලෝචනය 2024-II මැයෙන් උපදෙස් ලිපිය මගින්ද නිෂ්පාදනාගාර අධීක්ෂණය හා නිෂ්පාදනාගාර වාර්තා මාසිකව ගෙන්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත.

1

True copy

ඩී.පී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353. කෝට්ටේ පාර,
රාජගිරිය.

				1.4.සහකාර සුරාබදු කොමසාරිස්වරුන් (මාස දෙකකට වරක්), සුරාබදු අධිකාරීවරුන් (මාසයකට වරක්) මගින් නිෂ්පාදනාගාර අධීක්ෂණය වාර්තා මාසිකව ගෙන්වා ගැනීම	සමාගම 4කින් ගිණුම් වාර්තා ලබාගෙන ඇත.
				1.5.මත්පැන් නිෂ්පාදනාගාර හදිසි පරීක්ෂණය	නිෂ්පාදනාගාර හදිසි පරීක්ෂණය සඳහා සියලු සහකාර සුරාබදු කොමසාරිස් වරුන් වෙත 2024.01.17 හා 2024.03.11 දිනයන් හිද පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම වලදී උපදෙස් ලබා දී ඒ අනුව හදිසි පරීක්ෂණයන් සිදු කරනු ලැබේ.
				1.6.මූසි, ලේබල්, බෝතල් වැනි අමුද්‍රව්‍ය නිෂ්පාදනය සමග සංසන්දනය කිරීම	දෛනිකව/ මාසිකව නිෂ්පාදනය කරන බෝතල් ප්‍රමාණයන් හා දෛනිකව යොදාගන්නා ස්ටිකර් ප්‍රමාණයන් පිළිබඳ නිරන්තර විශ්ලේෂණයන් සිදු කෙරෙමින් පවතී.
				1.7.නිෂ්පාදනාගාරවල සියලුම අවසන් ගිණුම් ගෙන්වා ගැනීම	සියලුම මත්පැන් නිෂ්පාදනාගාරවල 2022 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත.
02	කෙටිකාලීන		මත්පැන් සෘජු අපනයනයන් හා වක්‍ර අපනයනයන් වර්ධනය කිරීම	2.1.අදාල සුරාබදු නිවේදනය සැකසීම.	
				2.2.Ready to drink වැනි නව මත්පැන් හා මිශ්‍ර මධ්‍යසාර වර්ග විදේශීය වෙළඳපොල ඉලක්ක කරමින් හඳුන්වා දීම.	RTD වැනි නව නිෂ්පාදනයන් හඳුන්වාදීම සඳහාත් නියාමනය සඳහාත් නීති සකස් කිරීමට සාකච්ඡා හා රැස්වීම් කිහිපයක් අදාල පාර්ශවයන් සමඟ පවත්වා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මේ සම්බන්ධයෙන් මුලික කෙටුම්පත 2024.06.05 දින මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
				2.3.විදේශීය වෙළඳපොල ඉලක්ක කර ගනිමින් Micro-Brewery නව බලපත්‍ර ලබාදීම.	Micro-Brewery හඳුන්වාදීම සඳහාත් නියාමනය සඳහාත් නීති සකස් කිරීමට අදාල පාර්ශව සමඟ සාකච්ඡා හා රැස්වීම

True copy

පී.ජී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
සංඛ. 353, කෝට්ටේ පාර.

					කිහිපයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ගැසට් පත්‍රයේ මුලික කෙටුම්පත සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
				2.4.අපනයනය සඳහා නව බලපත්‍රය ලබාදීම (සෘජු අපනයන).	සෘජු අපනයනයන් හා අපනයනයන් නියාමනය සඳහා මේ වනවිට නීති සැකසීම ආරම්භකර ඇත.
				2.5.ගුවන් තොටුපල බදු රහිත සාප්පු සංකීර්ණ, කොළඹ වරාය ව්‍යාපෘතිය, දේශීය හා විදේශීය නෞකා (වක්‍ර අපනයන) සඳහා නව මත්පැන් බලපත්‍ර ලබාදීම හා අදාල ගිවිසුම් ගනවීම.	වක්‍ර අපනයනයන් සඳහා නීති සැකසීම සඳහා මූලික සාකච්ඡා අදාල පාර්ශවයන් සමඟ මේ වන විට සිදු කොට ඇත. නීති සැකසීම ආරම්භ කර ඇත.
				2.6.අපනයන දිරිගැන්වීම සඳහා ඊට අදාල බදු අවකරණය.	අපනයනය කල මත්පැන් වෙනුවෙන් 2024.05.15 දින වන විට රු.බී. 3.9 ක බදු අවකරණයන් සිදුකොට ඇත. අපනයන දිරිගැන්වීම සඳහා බැංකු ඇපකරයක් තබාගෙන අදාළ මුලික ලේඛන ඉදිරිපත් කළ විගණනයට යටත්ව අපනයන බදු අවකරණ ලබා දීමට හැකිවන ලෙස 2024.05.31 දින 03/2024 වක්‍රලේඛය නිකුත් කර ඇත.
				2.7.Port city සඳහා නව බලපත්‍ර ලබාදීම.	Port city සඳහා නව බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයෙහි මූලික සාකච්ඡා පවත්වා ඇති අතර නීතීන් සැකසීම ආරම්භ කර ඇත.
				2.8.ජලජ යාත්‍රා සඳහා නව බලපත්‍ර ලබා දීම	නීති සකස් කිරීම ආරම්භ කර ඇත.
03	කෙටිකාලීන		නීත්‍යානුකූල නොවන මත්පැන් පාලනය සඳහා	3.1.දිවයින පුරා අපරාධ වාර්තා ග්‍රහන 39,000 ක් සිදු කිරීම.	2023 වර්ෂයට අදාල අපරාධ හා කාර්මික අපරාධ ග්‍රහන ඉලක්කයන් පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් 2024.01.08 දින පවත්වා ඇත. 2024.04.30 දින 2024 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

True copy

3

පී.ජී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය

			ක්‍රියාකිරීම මගින් මත්පැන් නිෂ්පාදනය ඉහල දැමීම.		සමාලෝචනය කොට ඇත. 2024.04.30 දින වන විට අපරාධ ග්‍රහන 10415 (75%) ක් හා කාර්මික අපරාධ ග්‍රහන 962 (55%) ක් සිදුකොට ඇත. ඉලක්ක වෙත ළඟාවීමේ ප්‍රතිශතය පිළිවෙලින් 75% හා 55% වේ.
				3.2.දිවයින පුරා බලපත්‍ර ස්ථාන සම්බන්ධ කාර්මික අපරාධ චාර්තා ග්‍රහන 4,500 ක් සිදු කිරීම	2024 ජනවාරි මස ඉලක්කයන් ලබා දී ඇත. ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් ග්‍රහන ඉලක්ක සම්පූර්ණ කිරීම සහ සමූහ ග්‍රහන සිදුකිරීමේ ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය සිදු කරමින් පවතී. මීට අමතරව නිළධාරීන්ගේ කාර්ය සාධනයේදී ග්‍රහන ඉලක්ක වෙත ළඟාවීම පිළිබඳව සලකා බලන අතර සෑම මාස හයකට වරක් සහකාර සුරාබදු කොමසාරිස් බල ප්‍රදේශය තුළ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම) ප්‍රධානත්වයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුකරනු ලැබේ. එනෙක් සුරාබදු ස්ථානාධිපති හා අදාල සුරාබදු අධිකාරි වරයා තම බල ප්‍රදේශ ග්‍රහන ඉලක්ක වෙත ළඟාවීම /සමූහ ග්‍රහන සිදු කිරීමේ ප්‍රගතිය පිලිබඳ අධීක්ෂණය සිදු කරයි.
				3.3.මාසික ග්‍රහන ඉලක්ක ලබාදීම	සියලු සුරාබදු කාර්යාල විශේෂ මෙහෙයුම් ඒකක සඳහා විශේෂ ග්‍රහන සිදුකිරීම සඳහා 2024.02.19 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අවශ්‍ය උපදෙස් ලබාදීමට ක්‍රියාකරන ලදී.
				3.4.ප්‍රාදේශීය කාර්යාලයන් හරහා ග්‍රහන සිදු කිරීම.	2024 ජනවාරි සිට 2024.04.30 දක්වා අපරාධ චාර්තා 10415 ක් හා කාර්මික අපරාධ චාර්තා 962 ක් සිදු කර ඇත.
				3.5.සහකාර සුරාබදු කොමසාරිස් බල ප්‍රදේශය තුළ සමූහ ග්‍රහන සිදු කිරීම.	2024.05.20 දිනෙන් ආරම්භ කර ඇති දින 100 සමූහ ග්‍රහණ

True copy

ජී.ජී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර.

				3.6.නිලධාරීන් වෙනත් සහකාර සුරාබදු කොමසාරිස් බල ප්‍රදේශ වල සමූහ ග්‍රහන සඳහා යෙදවීම.	වැඩසටහන මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි සියළුම ස්ථාන වලට ඉලක්කයන් ලබා දී ඇත. ඉහත දක්වා ඇති 39000 ඉලක්කයට අමතරව තවත් 5000 ක ඉලක්කයක් කරා ගමන් කිරීම මෙහි අරමුණ වේ. ඒ අනුව 2024.05.27 දින සිට 2024.06.02 දක්වා අපරාධ වාර්තා 1079 ක් හා කාර්මික අපරාධ වාර්තා 165 ක් සිදු කර ඇත.
				3.7.ව්‍යාජ ආරක්ෂිත මුද්‍රා සම්බන්ධ වැටලීම්	
				3.8.නීරූ බදු රහිත ආනයනික විදේශීය මත්පැන් වැටලීම් පුළුල්කිරීම	2024 ජනවාරි මස සිට 2024.04.30 දක්වා ග්‍රහණ 1066 ක් සිදු කර ඇත.
				3.9.ආරක්ෂිත මුද්‍රා නොමැති විදේශීය ආනයන මත්පැන් වැටලීම්	
04	කෙටිකාලීන		ආරක්ෂිත මුද්‍රා කළමනාකරණ පද්ධතිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.	4.1.නව මුහුණුවරකින් යුත් නව ආරක්ෂිත සලකුණු හඳුන්වාදීම	නව මුහුනුවරකින් නව ආරක්ෂිත සලකුනු හඳුන්වාදීම එළඹෙන ජූලි මසදී සිදු කිරීමට සැලසුම් සකස් කරමින් පවතී. 2024.03.25 ආරක්ෂිත කළමණාකරණ කමිටුව මගින් නව ආරක්ෂිත සළකුණු සහිත ස්ටිකරය නිකුත් කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ අනුව නිදර්ශක ලබා ගෙන මුද්‍රණය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.
				4.2.ආරක්ෂිත සලකුණු වල වර්ණය, පැහැය, නිර්මාණය, හැඩය , ප්‍රමාණය ආරක්ෂාකාරී ලෙස වෙනස්කිරීම.	නව මුහුණුවරකින් යුතු ඩිජිටල් කේතය පියවි ඇසට පෙනෙන පරිදි 2024 මැයි මස සිට මුද්‍රණය කිරීම ආරම්භ කර ඇත.
				4.3.හඳුන්වාදී ඇති ජංගම දුරකථන මෘදුකාංගය නිරන්තර අධීක්ෂණය.	WhatsApp group මගින් නිරන්තර තොරතුරු ලබා ගැනීම සහ අධීක්ෂණය කිරීම සිදුවේ. ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල මගින් දෛනිකව එම බල ප්‍රදේශ තුල බලපත්‍ර ස්ථානයන්

True copy

5

ජී.ජී.සී. සූ...
ප්‍රධාන අභ්‍යාස...
ශ්‍රී ලංකා සුරා...
අංක. 353. ...
රාජගිරිය.

					පරීක්ෂා කර වාර්තා කිරීම සිදු කෙරේ. 2024.05.31 දිනට ස.සු.කො. බල ප්‍රෙද්ශ 11 ක සුරාබදු කාර්යාල 21 ක් මගින් බලපත්‍ර ස්ථාන 207 ක නිෂ්පාදිත 459,385 ක් පරීක්ෂා කර ඇති අතර ස.සු.කො. බල ප්‍රෙද්ශ 2කට අදාළව ව්‍යාජ ස්ටිකර් යැයි සැක සහිත නිෂ්පාදිත හඳුනා ගෙන ඇත. ඒ සම්බන්ධයෙන් විමර්ශණ කටයුතු මෙවන විට සිදු කරමින් පවති.
				4.4.ප්‍රාදේශීය කාර්යාල මගින් දෛනිකව එම බල ප්‍රදේශ තුල බලපත්‍ර ස්ථානයන් අධීක්ෂණය හා වාර්තා කිරීම.	නිරන්තර අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවති.
				4.5.අවශ්‍ය තාක්ෂණික පුහුණුව ලබාදීම හා තාක්ෂණික ගැටලු නිරාකරණය.	ස්ටිකර් කලමනාකරණ පද්ධතිය සඳහා ලබන MSP ආයතනය මගින් එම කාර්ය සිදු කරණු ලබන අතර ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීම සඳහා නිලධාරීන් කාලීනව පුහුණු කිරීම සිදු කරනු ඇත. ව්‍යාජ ස්ටිකර් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය උපකරණද අවශ්‍ය අංශ වෙත මේ වන විට ලබා අවසන්ව ඇත. ඕනෑම අවස්ථාවක ග්‍රහන වලදී ඇතිවන තාක්ෂණික ගැටලු හා අවශ්‍ය විමසීම් සිදු කිරීම සඳහා සැපයුම් දාම නියාමන අංශය සමග සම්බන්ධවී ක්‍රියා කිරීමට උපදෙස් ලබාදී ඇති අතර WhatsApp group මගින් නිරන්තර තොරතුරු ලබා ගැනීම සහ අධීක්ෂණය කිරීම සිදු කෙරේ.
				4.6.අවශ්‍ය තාක්ෂණික උපකරණ නිලධාරීන්ට ලබා දීම.	
				4.7.ප්‍රාදේශීය නිලධාරීන් සිදුකරන ආරක්ෂිත ස්ටිකර් සම්බන්ධ ග්‍රහන හා තොරතුරු ජංගම දුරකථන මෘදුකාංගයක් හරහා හුවමාරු කර ගැනීම හා නිසි ක්‍රියාමාර්ග ගැනීම.	
				4.8.ආරක්ෂිත ස්ටිකර් සම්බන්ධව ප්‍රාදේශීය නිලධාරීන්ට ඇතිවන ගැටලු සඳහා ක්ෂණිකව ක්‍රියාමාර්ග ගත හැකි කමිටුවක් පත් කිරීම හා ඔවුන් ක්‍රියාවේ යෙදවීම.	2024.03.21 දිනැති ED/01/කමිටු/2024 ලිපිය යටතේ ආරක්ෂිත ස්ටිකර් සම්බන්ධව ප්‍රාදේශීය නිලධාරීන්ට ඇති ගැටලු සඳහා ක්ෂණිකව ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිලධාරීන් තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කොට ඇත.

True copy

පී.ඒ.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර.

				4.9.ආරක්ෂිත ස්ටිකර් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීමට ඒකකයක් පිහිටුවීම හෝ නිළධාරීන් පත් කිරීම.	
05	කෙටිකාලීන		නව බලපත්‍ර ලබාදීම	5.1.නව ර.බී.04 බලපත්‍ර 100ක් ලබාදීම.	පළමු කාර්තුව තුල ර.බී.04 බලපත්‍ර 58 ක් ලබාදී ඇත. (සුපිරි වෙළඳසල් 19 ,ඔිල්ලර වෙළඳ බලපත්‍ර 39)
				5.2.නිසි ක්‍රමවේදයක් යටතේ නව ර.බී.04 බලපත්‍ර ස්ථානගත කිරීම.	ර.බී.04 බලපත්‍ර ස්ථානගත කිරීමට අදාල 02/2024 ගැසට් පත්‍රය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.
				5.3.නව බලපත්‍ර ගාස්තු සු.නි 3/2024 අනුව අයකර ගැනීම.	සු.නි. 3/2024 අනුව ගාස්තු අයකර ගනිමින් පවතී.
				5.4.මේ වන විට නිකුත් කල බලපත්‍ර සඳහාද සු.නි. 3/2024 අනුව ගාස්තු අයකර ගැනීම.	
				5.5.මෘදු බලපත්‍ර හිමි බලපත්‍රධාරීන්ට සංචාරක ප්‍රවර්ධන අධිකාරිය අනුමත ර.බී.22බී බලපත්‍ර ලබා ගැනීමේ හිමිකම ලබාදීම.	මෘදු බලපත්‍ර හිමි බලපත්‍රධාරීන්ට ර.බී 22බී බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් වෙමින් පවතී. 2024 වර්ෂය සඳහා අයදුම්පත්‍ර 101 ක් ලබා දී ඇත.
06	කෙටිකාලීන		බලපත්‍ර අලුත් කිරීම	6.1. බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු සු.නි.3/2024 අනුව අයකර ගැනීම.	සු.නි. 3/2024 අනුව ගාස්තු අයකර ගනිමින් පවතී.
				6.2. සු.නි.3/2024 හි ii උපලේඛනය අනුව අදාල හිඟ ආරක්ෂිත තැන්පතු ඉදිරි මාස 11ට අයකර ගැනීම.	වසර අවසාන වන විට හෝ 2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අය කිරීමේදී අය කර ගැනීමට අවශ්‍ය උපදෙස් අදාළ නිලධාරීන් වෙත ලබා දී ඇත.

True copy

පී.ජී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා පුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

07	කෙටිකාලීන		හිඟ බදු අයකර ගැනීම	7.1.හිඟ බදු අයකර ගැනීම සඳහා කාලානුරූප සැලසුමක් සැකසීම හා අයකර ගැනීම. 7.2.අදාල බලපත්‍රධාරීන් නිෂ්පාදනය සිදු කෙරෙන අතරතුර ගිවිසුමක් අනුව අදාල හිඟ බදු අය කිරීම.	ක්‍රමවත් සැලැස්මට එකඟව ගිවිසුම් ගතවී ඒ අනුව හිඟ බදු අයකර ගනිමින් පවතී. 2024 වර්ෂයේ අයකර ගැනීමේ ඉලක්කය: රු.බි. 1.5 2024.05.30 දිනට අයවීම: රු.බි. 0.35
08	කෙටිකාලීන		අමුද්‍රව්‍ය මත බද්ද නිසි පරිදි අයකර ගැනීම.	8.1.සෑම මසකම 1-15 හා 16-31 සඳහා අමුද්‍රව්‍ය මත බද්ද අයකර ගැනීම. 8.2.අදාල ස්කාගාර නිලධාරීන් දැනුවත් කිරීම.	අමුද්‍රව්‍ය මත බද්ද නිසියාකාරව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකසා නිසි පරිදි බදු අය වෙමින් පවතී. මෙම කාර්තුව තුළ පැවති නිෂ්පාදනාගාර නිලධාරීන් සඳහා වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් හා පුහුණු වැඩසටහන් මගින් දැනුවත් කිරීම් සිදු කර ඇත. 2024 ජනවාරි මස 16 දින දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත. 2024 ජූනි මස පළමු සතිය තුළ දෙවන වැඩසටහන පැවැත්වීම සඳහා කටයුතු යොදා ඇත.
09	කෙටිකාලීන		මත්පැන් බලපත්‍ර සම්බන්ධ විරෝධතා විසඳීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග විධිමත් කිරීම.	9.1.මත්පැන් බලපත්‍ර සම්බන්ධයෙන් වූ විරෝධතා පිළිබඳව කටයුතු කිරීම සඳහා වූ මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම.	සුරාබදු නිවේදන 02/2024 යටතේ බලපත්‍ර ලබා දීමේදී මාර්ගෝපදේශ හා කොන්දේසි හඳුන්වා දී ඇත.

True copy

ජී.ජී.ජී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

10	කෙටිකාලීන		අපතය මත අය කෙරෙන බදු කළමනාකරණය	10.1.අපතයන් සම්බන්ධව ප්‍රායෝගික ප්‍රතිශතයන් හඳුන්වා දී සුරාබදු නිවේදනයක් සැකසීම(මේ වන විටත් අදාල මාර්ගෝපදේශ හා නිර්දේශ මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.) 10.2.අපතය මත බදු අයකර ගත යුතු නිෂ්පාදනාගාර වලින් බදු අය කිරීම. 10.3.අපතය සඳහා අය කෙරෙන බදු අයකර ගැනීම සඳහා අදාල විෂය සඳහා නිලධාරීන් පත් කිරීම	2024.04.08 දිනැති ED/05/01පොදු/2024 ලිපිය මගින් මත්පැන් නිෂ්පාදනයේදී, ගබඩා කිරීමේදී සිදුවන අපතයන් සමාලෝචනය සඳහා නිලධාරීන් 6 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කොට ඇත. එම කමිටු නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත.
11	කෙටිකාලීන		ආනයන විදේශ මධ්‍යසාර බද්ද	11.1.නව බලපත්‍ර ලබා දීම (ර.බී.03)	ලැබෙන අයදුම්පත්‍ර සළකා බලා අමාත්‍යාංශය වෙත නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ. 2023 වර්ෂය සඳහා නව බලපත්‍ර 10ක් නිකුත් කර ඇති අතර 2024 වර්ෂය සඳහා බලපත්‍ර මෙතෙක් නිකුත් කර නොමැත
12	කෙටිකාලීන		බීඩි කර්මාන්තය නියාමනය	12.1.බුද්ධිමය දේපල පනත යටතේ වෙළඳ සළකුණ හා නාමය ලියාපදිංචි කල නිෂ්පාදකයන්ට පමණක් බීඩි නිෂ්පාදනය/ගබඩා කිරීම සඳහා අවසර දීම අවසරපත් ලබාගත් බීඩි නිෂ්පාදකයින්ට පමණක් බීඩි නිෂ්පාදනයට හා ගබඩා කිරීම සඳහා අවසර දීම. 12.2.බදු ගෙවීමකින් තොරව වෙළඳපලට බීඩි සංසරණය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය. 12.3.බීඩි දුම්කොළ බදු ආදායම වර්ධනය සඳහා නිලධාරි කමිටුවක් පත් කිරීම.	බීඩි දුම්කොළ බදු ආදායම ප්‍රවර්ධනය සඳහා සියලු බීඩි නිෂ්පාදකයන්, දුම්කොළ හා තෙන්දු කොළ ආනයනකරුවන් ප්‍රධාන කාර්යාලය වෙත කැඳවා දෙපාර්ශවයේම අදහස් අනුව සකස් කරන ලද සැලසුම් මත පදනම්ව බීඩි දුම්කොළ ආදායම ප්‍රවර්ධනය සඳහා කටයුතු ආරම්භ කර ඇත. මීට අමතරව බීඩි දුම්කොළ බදු ආදායම රැස්කිරීම සම්බන්ධව ක්‍රියා කිරීමට 2024.01.30 දිනැති ED/01/Committies ලිපිය මගින් නිලධාරීන් 6 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කොට කටයුතු කරගෙන යනු ලබයි.

True copy

ඒ.ජී.සී. කුමාරි
ප්‍රධාන පරීක්ෂන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර
නාපගිරිය.

					බීඩි දුම්කොළ බදු ආදායම ප්‍රවර්ධනය සඳහා සියළු බීඩි නිෂ්පාදකයන් , දුම්කොළ හා තෙන්දු කොළ ආනයනකරුවන් ප්‍රධාන කාර්යාලය වෙත කැඳවා 2024.01.26, 2024.02.05,06,07,09,13,14,16,20,21,26,27,28, 2024.03.01,04,05 හා 2024.06.03 දිනවලදී දැනුවත් කිරීම් සිදුකර ඇත.
				12.4.තෙන්දුකොළ නීති පද්ධතියට ගෙන ඒම සඳහා සුරාබදු නිවේදනය නිකුත් කිරීම.	2024.06.03 දින අදාළ කෙටුම්පත මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත
				12.5.දුම්කොළ බදු පනත සංශෝධනය	
				12.6.තෙන්දු කොළ ආනයනය හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම.	
				12.7.තෙන්දු කොළ හා බීඩි දුම්කොළ ආනයනකරුවන් දැනුවත් කිරීම.	මේ සඳහා 2024.04.19 දින01/2024 වක්‍රලේඛය නිකුත් කර ඇත.
				12.8.බීඩි දුම්කොළ ආනයනකරුවන් විසින් බීඩි නිෂ්පාදකයන් හට නිකුත් කල දුම්කොළ ප්‍රමාණයන් පිළිබඳ වාර්තා ලබා ගැනීමට, විමර්ෂණය හා විගණනය.	01/2024 වක්‍රලේඛය අනුව මාසික කොග වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇත.
				12.9.බීඩි නිෂ්පාදකයන් තමන් වසර තුල ලබාගත් බීඩි දුම්කොල වලට සාපේක්ෂව බීඩි දුම්කොළ බද්ද අයකර ගැනීමට ක්‍රියා කිරීම	මෙම වක්‍රලේඛය අනුව බීඩි හා බීඩි නිෂ්පාදන ආශ්‍රිත අමුදව්‍ය ප්‍රවාහනය සඳහා 2024.05.01 දින සිට බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කර ඇත. 2024.06.10 දින සිට විමර්ශණයන් ආරම්භ කිරීමට සැළසුම් කර ඇත.

True copy

පී.ජී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

13	කෙටිකාලීන		දුම්කොළ බද්ද ලබා ගැනීම කාර්යක්ෂම කිරීම	13.1.දුම්කොළ සම්බන්ධයෙන් අනුයුක්ත නිලධාරීන් දැනුවත් කිරීම. 13.2.ආනයනික දුම්කොළ සඳහා වූ බද්ද නිසි පරිදි අය කිරීම	මාර්ග ගත ක්‍රමය ඔස්සේ බදු අයකර ගැනීමට ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.
14	මධ්‍යකාලීන		රසායනාගාරය ක් පිහිටුවීම	14.1.රසායනාගාරයේ ඉදිකිරීම් කටයුතු මෙම වර්ෂය තුල අවසන් කිරීම. 14.2.මත්පැන් සැපයුම් දාමයේ බහුවිධ අවස්ථාවන්හිදී ලබාගන්නා සාම්පල විශ්ලේෂණය කිරීමෙන් ඉහල ප්‍රමිතියක් පවත්වා ගැනීමට කටයුතු කිරීම.	රසායනාගාර ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති අතුරු අවශ්‍ය උපකරණ මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. රසායනාගාරයට අදාළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබාගෙන ඇත.
15	මධ්‍යකාලීන		CCTV කැමරා පද්ධතියක් ස්ථානගත කිරීම හා අධීක්ෂණය.	15.1.බලපත්‍රධාරීන් සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම. 15.2.අදාල ව්‍යාපෘතිය අධීක්ෂණය සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම හා අධීක්ෂණය 15.3.ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීම.	සම්පූර්ණ වාර්තාව හා යෝජනාවලිය සකස් කර 2024.06.04 දින අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. 2024.04.04 දින නිලධාරීන් පස්දෙනෙකුගෙන් යුතු අධීක්ෂණ කමිටුවක් පත් කර ඇත
16	මධ්‍ය කාලීන		අවධානම් කළමනාකරණ ඒකකයක් පිහිටුවීම (Risk	16.1. සුරාබදු ආදායම අඩු වීමට බලපාන ප්‍රධාන අවධානම් හඳුනා ගැනීම (නීති විරෝධී මත්පැන්, බදු මහහැරීම, දූෂණය, නිලධාරි නිහය)	අවධානම් කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහකාර සුරාබදු කොමිසාරිස් වරයෙක් පත් කොට ඇති අතර එය ඒකකයක් ලෙස පිහිටුවීමට කටයුතු සිදුකරමින් පවතී.

True copy

11

පී.ජී.සී. කුමාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

			Management		
17	දිගු කාලීන		සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් කළමනාකරණ පද්ධතිය (RASED) ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම	17.1. උපදේශනය RASED මෘදුකාංගය නිර්මාණය හා නඩත්තු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, පුහුණු කිරීම් සිදු කිරීම. 17.2. මත්පැන් නිෂ්පාදනාගාර හා සුරාබදු ප්‍රධාන කාර්යාලය අතරත් සෙසු ආදායම් දෙපාර්තමේන්තු හා භාණ්ඩාගාරය අතරත් සත්‍යාසන්න හා කාර්යක්ෂම හා ඍජු විද්‍යුත් දත්ත හුවමාරුවක් පවත්වා ගැනීම.	මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනු කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන උපදේශක වරයෙකුගේ සේවාව ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවක් 2024.05.31 දිනැති ලිපිය අනුව මුදල් අමාත්‍යාංශය විසින් පත්කර ඇත. 2024.05.22 දින පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත.

True copy

පී.ජී.ජී. කුමාර්
ප්‍රධාන ඉංජිනේරු විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

එම්.ජේ.ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

ඇමුණුම 02

අනු අංකය	නම	තනතුර
01	ඩී. එම්. සී. පී. ජයවර්ධන මයා	ප්‍රධාන සුරාබදු පරීක්ෂක
02	එස්. එච්. කේ. ආර්. විජේසිංහ	ප්‍රධාන සුරාබදු පරීක්ෂක
03	එස්. ඒ. පී. යමරකෝන් මයා	සුරාබදු පරීක්ෂක
04	එම්. එස්. තලගල මයා	සුරාබදු පරීක්ෂක
05	ජී. ආර්. එස්. ජයවංශ මයා	සුරාබදු පරීක්ෂක
06	එම්. සී. ඒ. බී. උඩපමුණුව මයා	සුරාබදු පරීක්ෂක
07	එස්. එස්. කේ. සිරිවර්ධන මයා	සුරාබදු පරීක්ෂක
08	ඒ. එම්. සෝමරත්න මයා	සුරාබදු පරීක්ෂක
09	ආර්. ඒ. ආර්. රණසිංහ මයා	සුරාබදු පරීක්ෂක
10	එම්. එල්. ආර්. ජේ. ප්‍රනාන්දු මයා	සුරාබදු පරීක්ෂක
11	එම්. ටී. පී. කුරේ මයා	සුරාබදු සැරයන්
12	පී. ජී. ජේ. සී ගමගේ මයා	සුරාබදු නියාමක
13	ජී. ඒ. ජැන්සන් මිය	කාන්තා සුරාබදු නියාමිකා

True copy

පී.ජී.සී. කුමාර
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කොළඹ 10

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා රේගුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 95

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදිකරගැනීම සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය
4	ශ්‍රී ලංකා රේගුවෙහි තොරතුරු තාක්ෂණය හරහා රජයේ ආදායම වර්ධනය කර ගැනීමට අදාළ සැලසුම්	ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියේ පළමු අදියරට අදාලව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී ඇත. ඒ අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබේ. 2024 සැප්තැම්බර් 23 වන දින පුවත්පත් දැන්වීම් ප්‍රකාශයට පත් කර පෙර-ලංසු සාකච්ඡාව 2024 සැප්තැම්බර් 30 වන දින පවත්වන ලදී. ලංසු 2024 නොවැම්බර් 04 වන දින වසා දමන ලද අතර ලැබී ඇති ලංසු යෝජනා 8 සඳහා තාක්ෂණික විශ්ලේෂණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියේ දෙවන අදියර සඳහා, ASYCUDA World පද්ධතියේ සංවර්ධකයෙකු වන UNCTAD ආයතනය 2024 සැප්තැම්බර් 27 වන දින යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනාව දැනටමත් ඇගයීමට ලක් කරමින් පවතින අතර, ඒ අතරතුර, දේශීය මෘදුකාංග සමාගමක් මඟින් මෘදුකාංගය සංවර්ධනය කිරීමේ හැකියාව සොයා බලයි. මේ වන විට, නැව් නියෝජිතයන් විසින් ASYCUDA සහ ASY Hub පද්ධති දෙකටම Bill of Lading දත්ත යොමු කරමින් පවතියි (Parallel run). දැනට ASY Hub පද්ධතිය තුළ නෞකා පැමිණීම (Vessel Arrival) පිලිබඳ පද්ධති සංවර්ධන කටයුත්තක් (System Development) සිදු කරමින් පවතී. මෙම පද්ධති සංවර්ධන කටයුතු අවසන් වූ පසු ASY Hub පද්ධතිය සක්‍රීය ලෙස Bill of Lading දත්ත ලබා ගැනීමට සම්බන්ධකර ASYCUDA පද්ධතියේ Bill of Lading ලබා ගැනීම සම්පූර්ණයෙන්ම නවතා දැමීමට කටයුතු කල හැක. මෙම කටයුතු නිම කිරීමෙන් පසු දෙවන අදියර ලෙස ASYCUDA පද්ධතිය තුලින් Pre- Arrival CUSDEC Processing කිරීමට හැකියාව ලැබේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 95 සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

පී.බී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව
"රේගු මන්දිරය"
අංක 40, කෙලිනි විදිය, කොළඹ 11

දෙපාර්තමේන්තුවේ නම : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 95

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්වය
<u>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙහි තොරතුරු තාක්ෂණය හරහා රජයේ ආදායම වර්ධනය කර ගැනීමට අදාළ සැලසුම්</u> නිරීක්ෂණ: • එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන EXBS වැඩසටහන මඟින් STRATLINK (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනාවලි අංක 1540 අනුව) ආනයන අපනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා පරිගණක පද්ධතියක් ප්‍රදානයක් ලෙස ලබා දීමට එකඟ වී ඇති බව. • 2023 අප්‍රේල් මස 24 සිට ආරම්භ කර ඇති මෙම පද්ධතියේ සංවර්ධන කටයුතු 2024 පෙබරවාරි මස අවසන් කිරීමට නියමිත බව.	STRATLINK පරිගණක පද්ධතියේ වැඩි දියුණු කිරීම්වලට අදාල පළමු සහ දෙවන මට්ටමෙහි (Stage 01 & 02) මෘදුකාංග සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි 2024.03.07 දින වන විට අවසන් කර ඇති අතර පරිගණක වැඩසටහන ආනයන අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා අඛණ්ඩව භාවිතා කළ හැකි වන පරිදි තව දුරටත් අවශ්‍ය වන තෙවන මට්ටමෙහි මෘදුකාංග සංවර්ධන කටයුතු ඉටු කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව හඳුනාගන්නා ලදි. ඒ අනුව තෙවන මට්ටමේ සංවර්ධන කටයුතු සිදු කරමින් පවතින අතර මේ වන විට එය අවසන් අදියරෙහි පවතී. 2024 ඔක්තෝම්බර් මස 25 වන දින පද්ධතිය නිල වශයෙන් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 95 සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක
ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.